චක්‍රලේඛ අංක : 1995/12.

මගේ අංකය 1/ආර්/19/1අ
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
1995.04.06 දින.

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත.

## පාසල් උත්සව සඳහා ආරාධනා

උක්ත කරුණ පිළිබඳව ම විසින් එවන ලද 1990.11.19 වන දින සහ 1990/47 දරණ චක්‍රලේඛය කෙරෙහි නැවතත්, ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

02 පාසල්වල පවත්නා වාර්ෂික ත්‍යාග ප්‍රධාන උත්සව හා ක්‍රීඩා උත්සව වැනි විශේෂ අවස්ථාවන්හිදී අතිගරු ජනාධිපතිතුමිය, ගරු අග්‍රාමාත්‍යතුමිය සහභාගි කරවා ගැනීමට අදහස් කරන්නේ නම්, උත්සවය පැවැත්වීමට මසකට කලින්වත් ඒ සඳහා යැවිය යුතු ආරාධනා පත් ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ පෞද්ගලික අනුමැතිය නොමැතිව එවැනි ආරාධනා පත් කෙලින්ම අතිගරු ජනාධිපතිතුමියට හෝ අග්‍රාමාත්‍යතුමියට නොයැවිය යුතු බව කරුණාවෙන් සලකන්න. ඇතැම්, උත්සවවලට පාසල් බලධාරීන් විසින් කෙලින්ම අතිගරු ජනාධිපතිතුමියට හා අග්‍රාමාත්‍යතුමියට ආරාධනා කරන බවත්, ඇතැම් විට ඊ පිළිබඳ දැනුම් දීමක් ගරු ඇමතිතුමාට හෝ අමාත්‍යාංශයට නොකෙරන බවත් පෙනෙන්නට ඇත. අදාල විදුහල්පතිවරුන් විසින් අතිගරු ජනාධිපතිතුමියට හෝ ගරු අග්‍රාමාත්‍යතුමියට ඔවුන් විසින් ම ආරාධනා කළහොත් ඒ බව වහාම අමාත්‍යාංශයට දන්විය යුතු බව ද සළකන්න.

03 මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය විසින් 1990 ඔක්තෝබර් මස ගන්නා ලද තීරණයක් අනුව ජනාධිපතිතුමා හෝ අග්‍රාමාත්‍යතුමා සහභාගි වන, තමන්ට අදාළ අමාත්‍යාංශය හා සම්බන්ධ අවස්ථා හා උත්සව කටයුතු වලට අමාත්‍යවරුන් සහ අමාතත්‍යාංශ නිලධාරීන් පැමිණ සිටිය යුතුය යන්න සැළකිල්ලට ගන්නා ලදී.

04 එවැනි අවස්ථාවලදී උද්ගතවිය හැකි විවිධ කරුණු සම්බන්ධයෙන්, අදාල අමාත්‍යවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්, මග පෙන්වීම් හා නිසියාකාර උපදෙස් ලබාදිය යුතු බැවින් මෙකී ක්‍රියා පිළිවෙල තරයේ අනුගමනය කිරීම අතිශයින්ම වැදගත් වේ. කැබිනට් අමාත්‍යවරයාට එවැනි, අවස්ථාවලට පැමිණීමට නොහැකි වන්නේ නම් නියෝජ්‍ය ඇමතිවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හෝ නියෝජනය විය යුතු වේ.

05 මේ කරුණු නිසා මෙවැනි ආරාධනා හා යෝජිත උත්සවයේ වැඩ සටහන් ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙත මා මගින් ඉදිරිපත් කළයුතු බව කරුණාවෙන් දැනුම් දෙමි. මෙහිදී ලියා පදිංචි තැපැලෙන් මෙවැනි ආරාධනා මගේ නමට හෝ ජාතික පාසල් භාර අතිරේක ලේකම්වරිය වෙත ලැබෙන්නට සැලැස්වීම අත්‍යවශ්‍ය ය. එවිට ගරු ඇමතිතුමාට දන්වා අවශ්‍ය වැඩ පිළිවෙළ සංවිධානය කර ගත හැකිය. කරුණාකර මේ චක්‍රලේඛ උපදෙස් තරයේ අනුගමනය කිරීමට සියලු ම අදාල නිලධාරීන් හා විදුහල්පතිවරුනට දැනුම් දෙන්න.

එම්. ඩී. ඩී. පීරිස්
ලේකම්
අධ්‍යාපන හා උසස්
අධ්‍යාපන අමාත්‍යාංශය